රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:344

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1986 සැප්තැම්බර් මස 30 වැනිදා

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## අනියම් පදනමක් මත පත්කිරීම්

අනියම් පත්කිරීම් සම්බන්ධයෙන්, ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 1:7 වගන්තියේ ඇතුළත්, පහත සඳහන් විධිවිධාන කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

> "හදිසි අවශ්‍යතාවයක් නිසා තාවකාලික තනතුරකට හෝ ස්ථිර තනතුරකට අනියම් පදනමක් මත යම්කිසිවකු පත්කිරීම (IV වැනි පරිච්ඡේදයේ 3 වගන්තිය බලන්න) හෝ යම් තනතුරක් නිත්‍ය වශයෙන් දරන නිලධාරියා සේවයට නොපැමිණීම නිසා එම තනතුරේ රාජකාරි ආවරණය කරනු පිණිස ආදේශකයෙකු පත්කිරීම හෝ අවශ්‍ය වූ විට ඒ සඳහා සලකා බැලිය යුත්තේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය යටතේ එම තනතුරට සුදුසුකම් ඇත්තාවූ පුද්ගලයෙකු පමණකි."

02. කරුණාකර තරයේම මෙම අවශ්‍යතාවය අනුව කටයුතු කිරීමට සටහන් කරගන්න.

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.